# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2459/29 - 2025 ඔක්තෝබර් මස 22 වැනි බදාදා - 2025.10.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16 (2ඈ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

යෝජිත එන්විෂන් ඩව් බේ මෙගාවොට් 150 + බොස් 23.8ක පුනර්ජනනීය බලශක්ති සුළං බල ව්‍යාපෘතිය

කල්පිටිය, පුත්තලම දිස්ත්‍රික්කය

**පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව**

1988 අංක 64 හා 2011 අංක 49 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16(1) වගන්තියේ විධිවිධාන වලට අනුකූලව කොළඹ 03, පෙන්ට්‍රිච් ගාර්ඩන්ස් 2/F, අංක 04 දරන ලිපිනයේ එන්විෂන් එනර්ජි ඉන්ටර්නැෂනල් ට්‍රේඩින් පුද්ගලික සමාගම විසින් ඉදිරිපත් කරන ලද කල්පිටිය ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිත මෙගාවොට් 150 + බෙස් 23.8 ක පුනර්ජනනීය බලශක්ති සුළං බල ව්‍යාපෘතිය සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව මහජන පරීක්ෂාව සඳහා පහත සඳහන් ස්ථානවල දිනපතා පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා 2025.10.22 දින සිට දින 30ක කාලයක් සඳහා තබා ඇත. (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හැර)

මීට අමතරව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.coastal.gov.lk මගින් එම වාර්තාව භාෂා තුනෙන්ම පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇත.

01. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, 4 වන මහල, නව මහ ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10.

02. මධ්‍යම පරිසර අධිකාරිය, අංක 104, "පරිසර පියස", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

03. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම.


1A - G 45606 — 23 (2025/10)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

04. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කල්පිටිය.

05. ප්‍රාදේශීය සභාව, කල්පිටිය.

06. මධ්‍යම පරිසර අධිකාරිය, දිස්ත්‍රික් කාර්යාලය, පුත්තලම.

07. වයඹ පළාත් පරිසර අධිකාරිය, මාලිගාව, කුරුණෑගල.

08. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් කාර්යාලය, පුත්තලම.

09. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය කාර්යාලය, කාක්කපල්ලිය, හලාවත.

මෙම යෝජිත ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බලපෑම් පිළිබඳ පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2025.10.22 දින සිට දින 30ක් (සති අන්ත සහ රජයේ නිවාඩු දිනන් හැර) ඇතුළත වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

මහාචාර්ය **පී. බී. ටර්නි ප්‍රදීප් කුමාර,**
අධ්‍යක්ෂ ජනරාල්,
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත්
කළමනාකරණ.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව,
නව මහලේකම් කාර්යාලය,
4 වන මහල, මාලිගාවත්ත,
කොළඹ 10.

දුරකථන අංක : 011 2449197, 011 2449754, 011 2387922
ෆැක්ස් අංක : 011 2438005, 0112472623
ඊ මේල් : dg.ccd.lk@gmail.com

EOG 10 - 0168